**නිපුණතාව 4.0** මානව සංස්කෘතියේ විශිෂ්ටතම නිර්මාණය සහ සංස්කෘතිය ප්‍රකාශ කිරීමේ ප්‍රධාන මාධ්‍ය භාෂාව ලෙස හඳුනාගෙන එය සන්නිවේදනය සඳහා ඉවහල් වන ආකාරය පිළිබඳ පෘථුල අවබෝධයක් ලබයි.

**නිපුණතා මට්ටම 4.1** සංස්කෘතිය, භාෂාව හා සන්නිවේදනය අතර පවතින සම්බන්ධතාව සහ භාෂාවේ ස්වලක්ෂණ විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 10

## ඉගෙනුම් පල

1. සංස්කෘතිය, භාෂාව සහ සන්නිවේදනය අතර පවතින අන්තර් සම්බන්ධතාව හඳුන්වයි.
2. මානව භාෂාවේ අනන්‍යතාව ප්‍රකට කරන ලක්ෂණ පැහැදිලි කරයි.
3. භාෂාත්මක කාර්ය විශ්ලේෂණය කරයි.
4. භාෂා ව්‍යවහාරය හා සමකාලීන ප්‍රවණතා පිළිබඳ ව නිදසුන් ඇසුරින් විස්තර කරයි.

## හැඳින්වීම

මානව වර්ගයා මෙතෙක් බිහි කරගත් විශිෂ්ට ම සන්නිවේදන මෙවලම භාෂාව වශයෙන් අවිවාදයෙන් ම පිළිගැනීමට සිදුවේ. ඒ අනුව මානව භාෂාව යනු කථනය භාෂණය සහ ලේඛනය සඳහා යොදා ගන්නා සංකේත සහ ඒවා හසුර වන ව්‍යාකරණ රීති ඇතුළත් සංකීර්ණ සමස්තය ලෙස දැක්විය හැකි ය. භාෂාවේ කථන ස්වරූප ඇති වී වසර දසදහස් ගණනකට පසු ලේඛනය ආරම්භ වූ බව වාග්විද්‍යාඥයන්ගේ මතය යි.

භාෂාව, මඟින් ඉටු කෙරෙන සමස්ත කාර්යය ඉටු කරගත හැකි වෙනත් මෙවලමක් තවමත් බිහි වී නොමැත. එනිසා එය සමාජය මඟින් නිපදවා ගැනුණු සන්නිවේදන උපකරණයක් ලෙසින් හඳුන්වා දිය හැකි ය. අදහස් හුවමාරු කරගැනීම, දැනුම ප්‍රකාශනය මෙන් ම සන්නිවේදන සඳහා ද භාෂාව උපයෝගී කර ගත හැකි ය. මෙකී හේතු නිසා භාෂාව සමාජයටත් සමාජය භාෂාවටත් අන්‍යෝන්‍ය බලපෑමක් සිදු කරයි. සමාජයක අභිවර්ධනය මෙන් ම පරිහානිය සඳහා බලපාන මිනිස් හැඟීම්, අදහස් සම්ප්‍රේෂණය කිරීම පිණිස භාෂාවක් අත්‍යවශ්‍ය වේ.

මානව භාෂාව හා සංස්කෘතිය අතර ඇත්තේ අවියෝජනීය සම්බන්ධතාවකි. සංස්කෘතික ආභාසය හෙවත් සංස්පර්ශය සෑම භාෂාවක ම දැකිය හැකි ය. සිංහල භාෂාව නිර්මාණය වීමේ දී පාලි සංස්කෘත ආදි භාෂාවන්ගේ සංස්පර්ශය ඇති වී තිබේ. එමෙන් ම එක් පරපුරක සංස්කෘතික ගති ලක්ෂණ තවත් පරම්පරාවකට සම්ප්‍රේෂණය කිරීමේ සන්නිවේදනාත්මක හා සමාජානුයෝජනාත්මක කාර්යාවලිය සඳහා ද භාෂාව ප්‍රමුඛ කාර්ය කොටසක් ඉටු කරයි.

භාෂාව වෙසෙසින් ම නිර්මාණාත්මක වේ. භාෂාව මඟින් උත්පාදනය වන සැම වචනයක, වාක්‍යයක ම ඇත්තේ අපූර්ව ගුණයකි. අප දන්නා සීමිත වචන යොදා ගනිමින් අසීමාන්තික අදහස් ප්‍රමාණයක් සන්නිවේදනය කළ හැකි නිසා භාෂාවෙහි දැකිය හැක්කේ අසීමාන්තික නිර්මාණාත්මක ගුණයකි. එමෙන් ම තව දුරටත් මානව භාෂාවේ අනන්‍ය ලක්ෂණ හා විශේෂතා රැසක් ද හඳුනා ගත හැකි ය. මානව භාෂාවේ ලක්ෂණයක් වන්නේ එය සහජයෙන් උරුම වන්නක් නොව වර්ධනය කළ යුතු හැකියාවක් වීම යි. මානවයා සතු භාෂා ශක්‍යතාව භාවිතය සමඟින් වැඩි දියුණු කළ යුතු හැකියාවකි. එමෙන් ම සෙසු සැම නිර්මාණයක් ම බිහි කිරීමට පදනම වන්නේ ද මානව භාෂාව යි. එම නිසා භාෂාව මුල් විමෙන් තොර ව සෙසු සැම නිර්මාණ බිහි නොවේ. මානව භාෂාව කාලානුරූපී ව හා පරිසරානුරූපී ව වෙනස් වේ. මෙයට අමතර ව ඇමරිකානු වාග් විද්‍යාඥ හොකට් මානව සන්නිවේදනයට විශේෂ වූ මූලධර්ම 07ක් භාෂාවෙහි දැකිය හැකි බව පෙන්වා දෙයි.

1. ද්විත්වතාව (ද්වයාත්මකතාව)
2. නිර්මාණාත්මක ගුණය (උත්පාදකතාව/ජනක ශක්තිය)
3 . රූඪීකෘතතාව (සම්මුතිකාර්ථවත් බව)
4 . ප්‍රත්‍යාවර්තනය
5 . විශිෂ්ටතාව / විශේෂීකරණය
6 . දූරස්ථාපනය
7 . සංස්කෘතික ප්‍රවාහණය

මෙයට අමතර ව භාෂාවේ විවිධ විශේෂතා හා අන්‍යතාව පිළිබඳ ව වාග් විද්‍යාඥයන් ප්‍රමුඛ කොටගත් සන්නිවේදන හා භාෂා විශාරදයෝ විවිධ අදහස් දක්වති. මානව භාෂාවේ කාර්යය පථය නිශ්චිත ව විග්‍රහ කළ හැකි නොවේ. එය පවතින සමාජ සංස්කෘතික මෙන් ම සන්නිවේදනාත්මක අවශ්‍යතා අනුව වෙනස් වේ. එහෙත් අධ්‍යයනයේ පහසුව සඳහා භාෂාවේ කාර්යය පහත පරිදි විශ්ලේෂණය කළ හැකිය.

1 . භාව ප්‍රකාශනය
2 . තොරතුරු සම්පාදනය
3 . දැනුම සම්පාදනය හා ව්‍යාප්තිය
4 . පෙලඹවීම
5 . සුහදතාව ප්‍රකාශ කිරීම
6 . විනෝදාස්වාදය

මානව භාෂාව මානව වර්ගයා සතු විශිෂ්ටමතම සන්නිවේදන මෙවලම වන අතර ම එහි එය කාලානුරූප ව විවිධ වෙනස් කම් දක්වයි. භාෂා ප්‍රවර්ග භාවිතයේ දී ඇති වන සමාජීය අවශ්‍යතාවන් අනුව වෙනස් වීම ස්වාභාවික කරුණකි. තාක්‍ෂණය හා සන්නිවේදනය වඩාත් වේගවත් මෙන් ම දියුණු අද්‍යතන සමාජයේ මානව භාෂා සුවිශේෂ වෙනස්කම්වලට භාජනය වෙමින් පවතී. සංකේත අක්ෂර, නව යෙදුම්, නව අර්ථ සම්පාදනය වන අතර ම ව්‍යවහාරයේ ද පැහැදිලි වෙනස්කම් දැකිය හැකි ය.

ජනමාධ්‍යය හා නව මාධ්‍ය මඟින් ඇති කරන භාෂා භාවිතයේ විවිධතා සෙසු සමාජීය සාධක මඟින් ඇති කරන්නා වූ භාෂා ප්‍රවණතාවට වඩා වැඩි ආකර්ෂණීය ස්වභාවයක් දරයි. එම භාෂා ප්‍රවණතා වඩාත් ජනප්‍රිය ලෙසින් සමාජය පුරා ව්‍යාප්ත වෙමින් පැවතීම හා භාවිත ප්‍රචලිත වීම සමඟ සමාජීය ගැටුම් ද නිර්මාණය වනු දැකිය හැකි ය

### 4.1 මානව සන්නිවේදනය හා භාෂාව

1. **සංස්කෘතිය, භාෂාව හා සන්නිවේදනය**
   - මානව, සන්නිවේදනය පුළුල් හා සංකීර්ණ ස්වභාවයක් ගන්නා බව.
   - මානව සංස්කෘතිය ගොඩනැංවීම කෙරෙහි භාෂාව ඉවහල් වී ඇති බව.
   - මානව සන්නිවේදනයේ ප්‍රබලතම උපකරණය මානවය භාෂාව බව.
   - මානව ශිෂ්ටාචාරයන් බිහි වීම කෙරෙහි ද භාෂාව සාධකයක් වී ඇති බව.
   - මානව භාෂාව සම්මුතික වූ වාක් සංකේත පද්ධතියක් බව
   - මානව සන්නිවේදනය හා භාෂාව මඟින් පැවැත්මට පරිබාහිර එනම් දැනුම, විචාරය, සංස්කෘතික සම්ප්‍රේෂණය, නිර්මාණාත්මක කාර්යය ආදිය සඳහා යොදා ගන්නා බව.
   - භාෂාවේ ප්‍රබල, අර්ථ සම්බන්ධතාව, සංකීර්ණත්වය අසීමිත වූ ප්‍රමාණය කළ නොහැකි වූ තත්ත්වයක් මානව සන්නිවේදනයෙහි පවතින බව.
   - සමාජයේ සාමූහික කොටස්කරුවන් ලෙස අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්ව සඳහා භාෂාව සන්නිවේදන මෙවලමක් ලෙස භාවිත වන බව.

2. **භාෂාව හා එහි ස්වලක්ෂණ අධ්‍යයනය**
   - මානව, භාෂාවට අනන්‍ය වූ සුවිශේෂතා පවතී.
   - ඒවා මානව භාෂාවේ ස්වලක්ෂණ වන බව.
   - මානව භාෂාවේ ස්වලක්ෂණ හතක් පවතින බව.
     1. ද්විත්වතාව/ ද්වෛතත්වය
        සීමිත වාක් සංකේත ප්‍රමාණයක් පුනරුත්ති සහිත ව එනම් නැවත නැවත යෙදීමෙන් අසීමිත අර්ථ ගොඩනැගීම
     2. උත්පාදක ගුණය/ජනකත්වය
        සීමිත වාක් සංකේත යොදා ගැනීමෙන් අවස්ථානුකූල ව අදහස් නිර්මාණශීලි ව උත්පාදනය කිරීම, එනම් සීමිත වූ වාක් සංකේත යොදාගනිමින් මින් පෙර අසා හෝ පවසා හෝ නැති අලුත් අදහසක් සිතිවිල්ලක් ගොඩනැගීමේ හැකියාව.

3. සම්මුතික භාවය

සම්මුතික භාවය යනු , යම් දෙයක් හා ඊට අදාළ වාක් සංකේතය අතර පවතින සම්බන්ධතාව යි.

උදා: ගස හැඳින්වීම සඳහා ගස යන සංඥාර්ථය සම්මුතියක් ලෙස භාවිතය

(මෙම කරුණු තුන පමණක් ඉගැන්වීම ප්‍රමාණවත් වේ. අනෙක් කරුණු ඇති බව පමණක් පෙන්වා දෙන්න)

4. භූමි පරිවර්තතාව/ කාර්ය මාරුව
5. ප්‍රතික්‍රියාමය විශේෂිකරණය
6. දූරස්ථාපනය/ ආසන්න ව්‍යුක්තතාව
7. සංස්කෘතික සම්ප්‍රේෂණය

**3. භාෂාත්මක කාර්ය විශ්ලේෂණය**

- භාෂාත්මක කාර්ය පහත ආකාරයෙන් දැක්විය හැකි බව.
  1. භාව ප්‍රකාශනය.
  2. තොරතුරු සම්පාදනය
  3. දැනුම සම්පාදනය හා ව්‍යාප්ත කිරීම.
  4. පෙලඹවීම සඳහා භාෂාව
  5. සුහදතාව ප්‍රකාශ කිරීම සඳහා භාෂාව.
  6. විනෝදාස්වාද සම්පාදනය කිරීම.

**4. භාෂා ව්‍යාවහාරය හා සමකාලීන ප්‍රවණතා**

- භාෂාව ගතිකත්වයෙන් යුක්ත බව.
- භාෂාව සංවර්ධනය වන පද්ධතියක් බව.
- භාෂා ව්‍යාවහාරය අනුව වෙනස් වීම්වලට ලක්වන බව.
- කාලීන අවශ්‍යතාව අනුව වෙනස් වීම්වලට ලක් වන බව.
- කාලීන අවශ්‍යතාව අනුව ගෝලීය භාෂා ප්‍රවණතා මතු වෙමින් පවතින බව.
- විවිධ සමාජයන් පොදු භාෂාවන් සන්නිවේදනය සඳහා භාවිතයට ගන්නා බව.
- තාක්ෂණයේ දියුණු සමඟ විවිධ භාෂා පොදුවේ පරිහරණය කරන බව

**නිපුණතාව 4.0** මානව සංස්කෘතියේ විශිෂ්ටතම නිර්මාණය සහ සංස්කෘතිය ප්‍රකාශ කිරීමේ ප්‍රධාන මාධ්‍යය භාෂාව ලෙස හඳුනාගෙන එය සන්නිවේදනය සඳහා ඉවහල් වන ආකාරය පිළිබඳ පෘථුල අවබෝධයක් ලබයි.

**නිපුණතා මට්ටම 4.2** ජනමාධ්‍ය කේන්ද්‍රීය භාෂාවේ විශේෂතා සහ මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යවල භාෂා භාවිතය හඳුනා ගනිමින් එය ඵලදායී ලෙස භාවිත කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 15

## ඉගෙනුම් පල

1. ජනමාධ්‍ය කේන්ද්‍රීය භාෂාව තුළ ඇති විශේෂතා හඳුන්වයි.
2. විඥාපනාත්මක භාෂාව හා නිර්මාණාත්මක භාෂාවේ විවිධත්වය, ලක්ෂණ සංසන්දනාත්මක ව දක්වයි.
3. මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය භාෂා භාවිත වන ආකාර ගවේෂණය කරයි.
4. මාධ්‍ය භාෂාව ඵලදායී ලෙස භාවිත කළ යුතු ආකාරය විස්තර කරයි.

## හැඳින්වීම

අද්‍යතන මානව සමාජයේ සැම අංශයක් කෙරෙහි ම ජනමාධ්‍ය ඉහළ බලපෑමක් ඇති කරයි. ජනමාධ්‍ය භාෂාව ද පුද්ගලයකුගේ සහ සමාජයේ භාෂා චර්යාව කෙරෙහි විශාල බලපෑමක් ඇති කරන සාධකයක් බවට පත් ව ඇත. නූතන වාග් විද්‍යාවෙහිලා හදාරනු ලබන ප්‍රධාන විෂය ක්ෂේත්‍රයක් ලෙස ද මෙය හැඳින්විය හැකි ය. භාෂාව,මානව අවශ්‍යතාවලට අනුරූපී ව ඓතිහාසික ව වර්ධනය වූ ප්‍රායෝගික භාවිතයකි. ජනමාධ්‍යයේ අවශ්‍යතාවලට සරිලන ආකාරයටත් නව මාධ්‍යයේ අවශ්‍යතාවලට සරිලන ආකාරයටත් එහි වර්තමාන සහ අනාගත හැඩය තීරණය වනු ඇත.

පුවත්පත, ගුවන් විදුලිය සහ රූපවාහිනිය යන මාධ්‍යයන් භාවිතයට පැමිණි පසු එතෙක් කතා කිරීමටත්, ලේඛනයටත් යොදාගත් භාෂාව භාවිත කිරීමට නව වේදිකාවක් ඉදි විය. එහෙත් මාධ්‍යවල දී භාෂාව භාවිත කළ යුත්තේ කෙසේදැයි නිර්මිතයක් ගොඩනැඟී නොතිබිණි. ජනමාධ්‍ය වල භාෂාව භාවිත කිරීම පිළිබඳ නිර්ණායක ගොඩනගා ගැනීමේ කාර්යය මාධ්‍ය හසුරුවන්නන් විසින් ම පවරා ගනු ලැබී ය. භාෂා ව්‍යවහාරයේ නවෝක්ති බිහි වීමත් ඒවා ප්‍රචලිත වීමත් ජනමාධ්‍යවේදීන්ගේ මැදිහත් වීමෙන් සිදු විය. විශේෂයෙන් ම මාධ්‍ය භාෂාව සාම්ප්‍රදායික භාෂාවේ පැවති අනම්‍ය හා දැඩි ස්වරූපය සුඛනම්‍ය කිරීමට හේතු විය. මාධ්‍ය මූලික භාෂාවේ මූලික අරමුණ වන්නේ පොදු ග්‍රාහකයා දිනා ගැනීම යි. භාෂාවේ සම්මතයන් ඉක්මවා යමින් වුව ද අපේක්ෂිත අරමුණ ඉටු කර ගැනීමට මාධ්‍යකරුවෝ පසුබට නොවූහ. ප්‍රකාශන මාධ්‍යයක් වශයෙන් භාෂාවේ ප්‍රකාශන හැකියාව වර්ධනය කිරීමට ජනමාධ්‍ය භාෂාව හේතු කාරක විය. නව වදන්, වාක්‍ය රටා,

රීති, ලේඛන ආකෘති මාධ්‍ය මූලික ව භාෂාවට දායාද විය. මෙම තත්ත්වය භාෂාවේ සංවර්ධනීය අවස්ථාවක් ලෙස සැලකිය හැකි වුවත් සංස්කෘතික දෘෂ්ටිකෝණයට අනුව බලන කල්හි භාෂාවක අනන්‍යතාව බිඳ වැටීම සංස්කෘතික පරිහානියකි.

පොදුවේ ජනමාධ්‍යයට අදාළ සුවිශේෂ ලක්ෂණ ඒ ආශ්‍රිත භාෂාවේ හැඩය කෙරෙහි බලපාන සාධකයකි. ජනමාධ්‍ය භාෂාවේ හැඩගැස්වීම කෙරෙහි අදාළ වන ජනමාධ්‍යයේ සාධක කිහිපයක් හඳුනාගත හැකි ය.

- ප්‍රතිපෝෂණය ප්‍රමාද වීම
- මාධ්‍යයේ ග්‍රාහක පිරිස විවිධත්වයෙන් යුතු වීම නිසා සියලු දෙනාට ම තේරුම් යන ලෙස භාෂාව යොදා ගැනීමට සිදු වීම.
- විද්‍යුත් මාධ්‍ය නැවත නැවත පරිහරණය කළ නොහැකි වීම
- ග්‍රාහක අවධානය පහසුවෙන් සහ ඉක්මනින් ලබා ගැනීමට උත්සාහ දැරීම
- ඉඩ සහ කාලය සීමිත වීම

ජනමාධ්‍ය මූලික ව භාෂා භාවිතයේ ස්වරූප දෙකක් හඳුනාගත හැකි ය. විඥාපනාත්මක භාෂාව නිශ්චිත තොරතුරක් පැහැදිලි භාෂා ශෛලියකින් යුතු ව පාඨකයා වෙත ඉදිරිපත් කෙරෙයි. එමගින් වාච්‍යාර්ථ ජනනය වෙයි. නිර්මාණාත්මක භාෂාව මඟින් යම් තොරතුරක් අපූර්වත්වයෙන් යුතු ව ප්‍රකාශ කෙරෙයි. ඒ සඳහා උපමා, රූපක අතිශයෝක්තිය වැනි අලංකාර විධි භාවිත කෙරෙයි. ජනමාධ්‍ය සන්දේශ අතර විඥාපනාත්මක භාෂාව යොදා ගන්නා සන්දේශ මෙන් ම නිර්මාණාත්මක භාෂාව යොදා ගන්නා සන්දේශ ද දක්නට ලැබෙන අතර සමහර සන්දේශවල මෙම ස්වරූප දෙක ම මිශ්‍ර ව භාවිත කෙරෙයි. මාධ්‍යකරුවා ඒ පිළිබඳ අවබෝධයෙන් යුතු ව භාෂාව හැසිරවීම වැදගත් වේ.

මුද්‍රිත මාධ්‍යයක් ලෙස පුවත්පත ද විද්‍යුත් මාධ්‍ය ලෙස ගුවන්විදුලිය සහ රූපවාහිනිය ද අනන්‍යතාවකින් යුතු ව මාධ්‍ය භාෂාව හැඩගස්වා ගෙන ඇත. මුද්‍රිත මාධ්‍යයේ භාෂා භාවිතයේ දී පහසුවෙන් සහ ඉක්මනින් කියවා ගත හැකිවීම, පාඨක අවධානය දිනා ගැනීම, පාඨක සංවේදිතාව පවත්වා ගැනීම වැනි දෑ පිළිබඳ අවධානය යොමු කෙරෙයි. විද්‍යුත් මාධ්‍ය භාෂාව ග්‍රාහයාට එක් වර ම ග්‍රහණය කර ගැනීමට පහසු වන සේ භාවිත වෙයි. ගුවන්විදුලි මාධ්‍යයේ ශ්‍රව්‍ය ගෝචර බස් වහරක් යොදා ගැනේ. එමෙන් ම භාෂාව යොදාගෙන පරිකල්පනය ගොඩනැංවීම කෙරෙහි අවධානය යොමු කෙරෙයි. පොදුවේ ගත් කල සියලු ම ජනමාධ්‍ය පොදු ග්‍රාහක ක්ෂේත්‍රයක් ඉලක්ක කර ගනිමින් සරල සුගම භාෂා ව්‍යවහාරයක් පවත්වා ගනියි. නව මාධ්‍ය භාවිතය ඉහළ යාම සමඟ භාෂා භාවිතයේ නව ප්‍රවණතා ද බිහිවෙමින් පවතියි. එක් එක් මාධ්‍යයට අදාළ භාෂා භාවිතයේ සුවිශේෂතා අනුව කථනය හෝ ලේඛනය හෝ යොදා ගැනීමෙන් මාධ්‍ය භාෂාවේ ඵලදායීතාව ඉහළ නංවා ගත හැකි ය.

අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට යෝග්‍ය භාෂාව ඵලදායි භාෂාව යි. අරමුණු ඉටු කර ගැනීම සඳහා ප්‍රතිමාන පිළිබඳ ව සැලකිලිමත් විය යුතු ය. ප්‍රතිමාන යනු භාෂාවක සම්මතය යි. ව්‍යාකරණ රීති, අක්ෂර වින්‍යාසය, විරාම ලක්ෂණ, පද බෙදීම, උච්චාරණය, ලේඛන ආකෘති ආදිය භාෂාවක් කලක් තිස්සේ භාවිත වෙමින්, පැවත ඒම නිසා සම්මත වූ ප්‍රතිමාන වේ. ප්‍රතිමාන නොසලකා හැරීමෙන් අපේක්ෂිත අදහස් එලෙසින් ප්‍රකාශ නොවීම සිදු විය හැකි ය.

## 4.2 ජනමාධ්‍ය හා භාෂාව

### 1. ජනමාධ්‍ය මූලික භාෂාව

- මිනිසා දෛනික ජීවිතයේ දී කථනය සහ ලේඛනය සඳහා යොදා ගත් භාෂා ව්‍යවහාරය ම ජනමාධ්‍ය සඳහා යොදා ගන්නා බව.
- ජනමාධ්‍යයෙහි පවතින සුවිශේෂතා අනුව එම මාධ්‍ය හසුරුවන්නන් විසින් ජනමාධ්‍ය මූලික භාෂාව ගොඩනගාගෙන ඇති බව.
- පොදුවේ ජනමාධ්‍ය සඳහා යොදා ගන්නා භාෂාවේ සුවිශේෂතා හඳුනා ගත හැකි බව.
  1. ජනමාධ්‍යයෙහි භාෂාව සරල විය යුතු වීම.
  2. ග්‍රාහකයා නිරවුල් භාෂාවක් භාවිත වීම.
  3. පොදු භාෂාවක් වීම.
- පුවත් පත, ගුවන් විදුලිය, රූපවාහිනිය සඳහා යොදා ගන්නා භාෂාවේ සුවිශේෂතා හා ඊට අනන්‍ය භාෂාත්මක ලක්ෂණ ද ඇති බව.

### 2. විඥාපනාත්මක භාෂාව හා නිර්මාණාත්මක භාෂාව

- තොරතුරු සන්නිවේදනය කිරීම සඳහා විඥාපනාත්මක භාෂාව යොදා ගන්නා බව.
- ප්‍රවෘත්ති, විෂය කරුණු, ශාස්ත්‍රීය ලේඛන ආදියෙහි විඥාපනාත්මක භාෂාව යොදා ගන්නා බව.
- විඥාපනාත්මක භාෂාව භාවිත කිරීමේ මූලික අරමුණ නිරවුල් ව ප්‍රකාශ කිරීම බව.
- විඥාපනාත්මක භාෂාවේ දී කෝෂාර්ථය හෙවත් වාච්‍යාර්ථය යොදා ගැනෙන බව.
- භාෂාවේ සම්මුතික අර්ථවලින් ඔබ්බට යමින් අදහස් ප්‍රකාශ කිරීම සඳහා යොදා ගන්නා භාෂාව නිර්මාණාත්මක භාෂාව බව.
- නිර්මාණාත්මක භාෂාවේ දී ලක්ෂ්‍යාර්ථ හෙවත් ද්විතියක අර්ථ හා ව්‍යංග්‍යාර්ථය යොදා ගන්නා බව.
- නිර්මාණාත්මක භාෂාව අවබෝධ කර ගැනීම සඳහා ව්‍යංග්‍යාර්ථ හා අත්දැකීම් අවබෝධ කර ගැනීමේ හැකියාව පැවතිය යුතු බව.
- නිර්මාණාත්මක භාෂාව නිර්මාණකරුවාගේ දෘෂ්ටිය අනුව වෙනස් විය හැකි බව.

**3. මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය භාෂා භාවිතය**

- පුවත් පත් සඟරා හා වාර ප්‍රකාශන මුද්‍රිත මාධ්‍ය ලෙස සැලකෙන බව.
- ගුවන්විදුලිය හා රූපවාහිනිය විද්‍යුත් මාධ්‍ය ලෙස සැලකෙන බව.
- අන්තර්ජාලය ආශ්‍රිත සන්නිවේදන මෙවලම් ආශ්‍රය කර ගනිමින් බිහි වූ වෙබ් අඩවි, බ්ලොග් අඩවි, ජංගම දූරකථන මෘදුකාංග ආදිය නව මාධ්‍ය ලෙස සලකන බව.

**මුද්‍රිත මාධ්‍ය භාෂා භාවිතය**

- සරල භාෂාව
- කෙටි වාක්‍ය
- නිර්මාණශීලි භාෂාව
- සංක්ෂිප්ත භාෂාව
- පාරිභාෂික වචන භාවිතය අඩු වීම.
- විද්‍යුත් මාධ්‍යට සාපේක්ෂ ව විස්තරාත්මක බව.

**විද්‍යුත් මාධ්‍ය භාෂා භාවිතය**

- ගුවන් විදුලිය තුළ කෙටි වාක්‍ය
  - සරල භාෂාව
  - පරිකල්පිත භාෂාව
  - වැඩසටහන් ආකෘතිය අනුව භාෂා භාවිතය
- රූපවාහිනී මාධ්‍යයේ දී රූපයට ප්‍රමුඛත්වය ලබා දී භාෂාව අඩුවෙන් යොදා ගැනීම.
  - සරල භාෂාව
  - කෙටි වාක්‍ය
  - නිවැරදි උච්චාරණය
  - නිවැරදි භාෂාව
  - වැඩසටහනට අනුව භාෂා භාවිතය.
- නව මාධ්‍යවල භාෂා භාවිතය.
  - සංක්ෂිප්ත භාෂා භාවිතය.
  - අන්තර්ජාතික භාෂා වැඩි වශයෙන් භාවිතය.
  - දේශීය භාෂා භාවිතය සඳහා මෘදුකාංග භාවිත කිරීමට සිදු වීම.
  - කෙටි ලේඛන ක්‍රම භාවිත කිරීමේ ප්‍රවණතාවක් පැවතීම.
  - දේශීය භාෂාව ඉංග්‍රීසි අකුරු යොදා ලිවීම.

**4. මාධ්‍ය භාෂා භාවිතයඃ ඵලදායිතාව හා ප්‍රතිමාන**

- අපේක්ෂිත අරමුණු ඉටු කර ගත හැකි වන පරිදි මාධ්‍ය මඟින් භාෂාව යොදා ගෙන අදහස් ප්‍රකාශ කිරීම මාධ්‍ය භාෂා භාවිතයේ ඵලදායිතාව ලෙස හැඳින්වෙන බව.
- ඒ ඒ මාධ්‍යයේ සුවිශේෂතාවලට අනුව කථනය හා ලේඛනය යොදා ගැනීමෙන් ඵලදායි ලෙස ජනමාධ්‍ය භාෂාව භාවිත කළ හැකි බව.
- ඵලදායි භාෂා භාවිතය සඳහා භාෂා ප්‍රතිමාන පිළිබඳ ව සැලකිලිමත් විය යුතු බව.
- භාෂා භාවිතයේ ප්‍රතිමාන යනු භාෂාවේ සම්මතය බව.
- භාෂාවක් කලක් තිස්සේ භාවිත වීමෙන් සමාජය තුළ ගොඩනැගෙන සම්මතය ප්‍රතිමාන ලෙස තව දුරටත් දැක්විය හැකි බව.
- ආකෘතිගත රචනය, ව්‍යාකරණ රීති, අක්ෂර වින්‍යාසය, උච්චාරණය විරාම ලක්ෂණ ආදිය අදාළ මාධ්‍යයට උචිත පරිදි යොදා ගත යුතු බව.
- භාෂාවේ ප්‍රතිමාන නොසලකා හැරීමෙන් අපේක්ෂිත අදහස් ප්‍රකාශ නොවීමට ඉඩ ඇති බව.

**නිපුණතාව 4.0** මානව සංස්කෘතියේ විශිෂ්ටතම නිර්මාණය සහ සංස්කෘතිය ප්‍රකාශ කිරීමේ ප්‍රධාන මාධ්‍ය භාෂාව ලෙස හඳුනාගෙන එය සන්නිවේදනය සඳහා ඉවහල් වන ආකාරය පිළිබඳ පෘථුල අවබෝධයක් ලබයි.

**නිපුණතා මට්ටම 4.3** සාක්ෂරතාව හා මාධ්‍ය සාක්ෂරතාව සාංකල්පික ව හඳුනාගෙන එහි කාලීන අවශ්‍යතාව, අදාළතාව සහ බලපෑම විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 12

## ඉගෙනුම් පල

1. සාක්ෂරතාව හා භාෂාව සාංකල්පික ව හඳුන්වයි.
2. මාධ්‍ය සාක්ෂරතාව යනු කුමක් දැයි අර්ථ නිරූපණය කරයි.
3. මාධ්‍ය සාක්ෂරතාවෙහි කාලීන වැදගත්කම සහ එහි අදාළතාව පැහැදිලි කරයි.
4. මාධ්‍ය සාක්ෂරතාවෙහි භාෂාත්මක ශක්‍යතාව සහ බලපෑම් නම් කරයි.

## හැඳින්වීම

භාෂාව මානවයාගේ ප්‍රධානතම සන්නිවේදන මෙවලම යි. එය අර්ථ පූර්ණ මාධ්‍යයකි. කිසියම් නිශ්චිත පිළිවෙළකට සකස් වූ සංඥා පද්ධතියක් ලෙස ද හැඳින්විය හැකි ය. භාෂාව මගින් අදහස් හා තොරතුරු ඉදිරිපත් කෙරේ. භාෂා පරිහරණ හැකියාව පුද්ගලයකු නිසර්ගයෙන් ම ලබන්නකි. තමා හැදී වැඩෙන සමාජ පරිසරය ඇසුරු කරගෙන භාෂාව ග්‍රහණය කිරීමට හා පරිහරණය කිරීමට උගනී. එය මූලික සාක්ෂරතාව වේ.

සාක්ෂරතාව පිළිබඳ ප්‍රාථමික අර්ථය භාෂාව පිළිබඳ පළපුරුද්ද යන්න යි. භාෂාවක් ලිවීමට හා කියවීමට ඇති හැකියාව නූතනයේ සාක්ෂරතාව ලෙස පිළිගනු ලබයි. එය වර්ධනය කර ගත යුතු කුසලතාවකි. අද වන විට ක්‍රමික ව සාක්ෂරතාව යන්නෙහි අර්ථය විපර්යාසයට ලක් ව ඇත. භාෂාව පිළිබඳ හැකියාව පමණක් සාක්ෂරතා සංකල්පයෙන් විස්තර වන්නේ නැත. දෘශ්‍ය සාක්ෂරතා, ශ්‍රව්‍ය සාක්ෂරතා, පරිගණක සාක්ෂරතාව, තොරතුරු සාක්ෂරතාව, සංඛ්‍යාංක සාක්ෂරතාව, මාධ්‍ය සාක්ෂරතාව ආදි ලෙස ගොඩනැගී ඇත. දෘශ්‍ය සාක්ෂරතාව දෘශ්‍යමය අර්ථ පරාවර්තනය කර ගැනීමේ හැකියාව යි. ඉපැරණි ගුහා, චිත්‍ර, සම්භාව්‍ය සිතුවම්, ඡායාරූප, මූර්ති, සිනමාව, රූපවාහිනිය වැනි මාධ්‍යයන් පරිහරණය කිරීමේ දී දෘශ්‍ය සාක්ෂරතාව භාවිත වේ. ශ්‍රවණය වන සංඥා අර්ථ දක්වීමේ හැකියාව ශ්‍රව්‍ය සාක්ෂරතාවට අයත් වේ. ගුවන්විදුලි මාධ්‍ය ශ්‍රාවකයකුට තිබිය යුත්තේ ශ්‍රව්‍ය සාක්ෂරතාව යි. දෛනික කටයුතු සඳහා පරිගණකය භාවිත කිරීමේ හැකියාව පරිගණක සාක්ෂරතාව යි. තොරතුරු ග්‍රහණය කිරීම හා තෝරා ගැනීමේ හැකියාව තොරතුරු සාක්ෂරතාව වේ. සංඛ්‍යාංක තාක්ෂණික උපකරණ ඵලදායී ලෙස භාවිත කිරීමට ඇති හැකියාව සංඛ්‍යාංක සාක්ෂරතාව වේ.

මාධ්‍ය සාක්ෂරතාව පුද්ගලයකු සතු කුසලතා රැසක් හා සම්බන්ධ වේ. ශ්‍රව්‍ය සාක්ෂරතාව, දෘශ්‍ය සාක්ෂරතාව, භාෂා සාක්ෂරතාව ආදි කුසලතා රාශියක එකතුවක් ලෙස ද හැඳින්විය හැකි ය. මාධ්‍ය සාක්ෂරතාව යනු ප්‍රවේශ වීම, විචාරාත්මක ඇගයුම්, අවබෝධය, නිර්මාණය හා සන්නිවේදනය කිරීමේ හැකියාව ලෙස ද හැඳින්විය හැකි ය.

මාධ්‍ය මඟින් සෑම ආකාරයකින් ම ඉදිරිපත් කරනු ලබන සන්දේශ පරිහරණය කිරීමට, විශ්ලේෂණය කිරීමට, ඇගයීමට හා නිර්මාණය කිරීමට ඇති හැකියාව මාධ්‍ය සාක්ෂරතාව යි.

මාධ්‍ය සාක්ෂරතාව 1960, 70 දශකවල වර්ධනය වූ විෂය ක්ෂේත්‍රයක් ලෙස හැඳින්විය හැකි ය. මාධ්‍ය සන්දේශ නිර්මාණය කරන ආකාරය හඳුනා ගැනීම, මාධ්‍ය සන්දේශයක් පිළිබඳ විශ්වාසය, අදහස් ඒත්තු ගැන්වීම, තක්සේරු කිරීම, පවත්නා මාධ්‍ය ක්‍රම වෙනස් කිරීම සඳහා හඬ නැංවීම, මාධ්‍ය සාක්ෂරතා අධ්‍යයනයට අයත් වේ. ඒ අනුව ග්‍රාහකයාගේ දැනුම් සන්දර්භය, චින්තන කුසලතා, ලිවීමේ, කතා කිරීමේ හා සවන් දීමේ කුසලතා, පර්යේෂණ කුසලතා මාධ්‍ය සාක්ෂරතාවට අදාළ වේ.

මාධ්‍ය ප්‍රකාශනයක යථාරූපී පණිවිඩය නිවැරදි ව ග්‍රහණය කර ගැනීම සඳහා මාධ්‍ය සාක්ෂරතාව පුද්ගලයකුට හෝ සමාජයට හෝ අවශ්‍ය වේ. මෙ මඟින් පණිවිඩය සංවිධානය වී ඇති ආකාරය හඳුනා ගැනීමට හැකි වේ. බොහෝ විට, මතුපිටින් කියවෙන අදහස් ම වඩා විශ්ලේෂණාත්මක ව විග්‍රහ කිරීමේ දී මාධ්‍ය සාක්ෂරතාවේ අවශ්‍යතාව ඉස්මතු වේ. එමඟින් ග්‍රාහකයා කෙරෙහි සන්දේශයක බලපෑම නිවැරදි ව වටහා ගත හැකි ය.

මාධ්‍ය සාක්ෂරතාව පිළිබඳ ව විමසීමේ දී එහි බලපෑම හා භාෂාත්මක ශක්‍යතාව පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් වේ. එහි දී මාධ්‍ය සාක්ෂරතාවේ බලපෑම් සාධක යනුවෙන් දැක්වෙන්නේ, මාධ්‍ය සන්දේශ හේතුවෙන් ග්‍රාහක සමාජ වෙනස් කිරීමට හෝ හැසිරවීමට හෝ කටයුතු කරන ආකාරය යි. මෙහි දී භාෂාවෙහි ඇති විවිධාකාර ශක්තීන් මාධ්‍යයෙහි භාවිත වන ආකාරය අනුව භාෂාත්මක ශක්‍යතා හඳුනාගත හැකි ය.

### 4.3 භාෂාව, සාක්ෂරතාව හා මාධ්‍ය සාක්ෂරතාව

1. **සාක්ෂරතාව හා භාෂාව**
   - භාෂාවක් කියවීමට, ලිවීමට හා තේරුම් ගැනීමට ඇති හැකියාව භාෂා සාක්ෂරතාව වන බව.
   - නූතන සමාජයේ පුද්ගලයා සාර්ථක සමාජ ජීවිතයක් ගත කිරීමට භාෂා සාක්ෂරතාව අවශ්‍ය නිපුණතාවක් වන බව.
   - මාධ්‍ය සාක්ෂරතාව, තොරතුරු සමාජයක ජීවත් වන පුද්ගලයකුට සමාජ ජීවිතය පවත්වාගෙන යෑමට අවශ්‍ය වන බව.

2. **මාධ්‍ය සාක්ෂරතාව හඳුනා ගැනීම**

- මාධ්‍ය සාක්ෂරතාව යනු මාධ්‍ය මඟින් ඉදිරිපත් කෙරෙන සන්දේශ, පරිහරණය කිරීමට, විශ්ලේෂණය කිරීමට, ඇගයීමට හා නිර්මාණය කිරීමට ඇති කුසලතා බව.
- මාධ්‍ය සන්දේශයක් පරිහරණය කිරීම යනු මාධ්‍ය සන්දේශය, සංඥා, සංකේත තේරුම් ගැනීම හා මාධ්‍ය උපකරණ භාවිතය පිළිබඳ හැකියාව වන බව.
- මාධ්‍ය සන්දේශයක් විශ්ලේෂණය කිරීම මඟින් මාධ්‍ය සන්දේශයේ යම් අරුත් විග්‍රහ කරගත හැකි බව.
- ඇගයීමේ කුසලතාව යනු මාධ්‍ය සන්දේශයක් තමාට හෝ සමාජය වෙත හෝ එල්ල වන  බලපෑම තක්සේරු කරගත හැකි බව.
- නිර්මාණය කිරීමේ කුසලතාව යනු මාධ්‍ය සන්දේශය වගකීමෙන් හා ඵලදායී ව නිර්මාණය කිරීමේ හැකියාව බව.

3. **මාධ්‍ය සාක්ෂරතාවඃ අවශ්‍යතාව හා අදාළතාව**

- මාධ්‍ය නිදහස හෙවත් අදහස් ප්‍රකාශනයක් සහිත සමාජයක මාධ්‍යයෙන් සිදු වන අයහපත් බලපෑමෙන් මිදීම සඳහා මාධ්‍ය සාක්ෂරතාව අවශ්‍ය බව.
- ජනමාධ්‍යවල ක්‍රියාකාරිත්වයේ සැබෑ ස්වභාවය හඳුනා ගැනීමට මාධ්‍ය සාක්ෂරතාව අවශ්‍ය වන බව.
- මාධ්‍ය සන්දේශයන්හි අරමුණු තේරුම් ගැනීමට මාධ්‍ය සාක්ෂරතාව  අවශ්‍ය වන බව.
- විචාරශීලී ව මාධ්‍ය සන්දේශයක් ග්‍රහණය කර ගැනීම සඳහා අයහපත් බලපෑමෙන් මිදී සිටීමට මාධ්‍ය සාක්ෂරතාව අවශ්‍ය වන බව.
- රටක සංවර්ධනයට අවශ්‍ය සමාජීය මනස මෙහෙයවා ගැනීමට මාධ්‍ය සාක්ෂරතාව අවශ්‍ය වන බව.
- මාධ්‍යයෙන් සිදු වන අයහපත් බලපෑමට එරෙහි වීමට ග්‍රාහකයා බල ගැන්වීම සඳහා මාධ්‍ය සාක්ෂරතාව අවශ්‍ය බව.
- ඵලදායී හා සමාජය කෙරෙහි වගකීමෙන් යුතු මාධ්‍ය සන්දේශ නිර්මාණය කිරීමට මාධ්‍යකරුවාට මාධ්‍ය සාක්ෂරතාව අවශ්‍ය වන බව.

4. **මාධ්‍ය සාක්ෂරතාවඃ බලපෑම්, සාධක හා භාෂාත්මක ශක්‍යතා**

- මාධ්‍ය සාක්ෂරතාව ලැබීම හේතුවෙන් පුද්ගලයා මාධ්‍ය සන්දේශවලට නිරාවරණය වන බව.
- ග්‍රාහකයකු මාධ්‍ය සන්දේශයක් පරිහරණය කිරීමේ දී මාධ්‍ය සාක්ෂරතාවේ බලපෑමට ලක් වන බව.
- සන්දේශයක යටිපෙළ හඳුනා ගැනීමේ දී සාක්ෂරතාව බලපෑමට ලක් වන බව.
- ග්‍රාහක විචාරශීලීත්වය කෙරෙහි  මාධ්‍ය සාක්ෂරතාව බලපාන බව.
- මාධ්‍ය සාක්ෂරතාව ගුණාත්මක බවින් යුක්ත සන්දේශ නිර්මාණය කෙරෙහි මාධ්‍යකරුවා පොලඹවන බව.

**නිපුණතාව 4.0** මානව සංස්කෘතියේ විශිෂ්ටතම නිර්මාණය සහ සංස්කෘතිය ප්‍රකාශ කිරීමේ ප්‍රධාන මාධ්‍ය භාෂාව ලෙස හඳුනාගෙන එය සන්නිවේදනය සඳහා ඉවහල් වන ආකාරය පිළිබඳ ව පෘථුල අවබෝධයක් ලබයි.

**නිපුණතා මට්ටම 4.4** මාධ්‍ය සාක්ෂරතා මූලිකාංග, වැදගත්කම, තොරතුරු සන්නිවේදනය පිළිබඳ ව විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 15

## ඉගෙනුම් පල

1. මාධ්‍ය සාක්ෂරතාව පිළිබඳ මූලිකාංග හඳුන්වයි.
2. විඥාපන සන්නිවේදනය සඳහා මාධ්‍ය සාක්ෂරතාව වැදගත් වන ආකාරය පැහැදිලි කරයි.
3. මාධ්‍ය සාක්ෂරතාව හා විඥාපන සන්නිවේදනයේ සම්බන්ධතාව විග්‍රහ කරයි.
4. මාධ්‍ය සාක්ෂරතා අධ්‍යයනයේ ශ්‍රව්‍ය, දෘශ්‍ය ප්‍රවේශ සංසන්දනාත්මක ව පැහැදිලි කරයි.
5. සන්දේශ ප්‍රතිග්‍රහණය හා විශ්ලේෂණය පිළිබඳ ව හඳුන්වා දෙයි.

## හැඳින්වීම

භාවිත ස්වරූපය අනුව මාධ්‍ය සාක්ෂරතාවේ මූලිකාංග පිළිබඳ අවධානය යොමු කිරීමට හැකි ය. මෙහි දී තොරතුරු සාක්ෂරතාව, දෘශ්‍ය සාක්ෂරතාව, අංකිත සාක්ෂරතාව, විචාරාත්මක ව සිතීම, දැනුම ගොඩනැගීම ආදිය ගැන පැහැදිලි කළ හැකි යි. මාධ්‍ය සාක්ෂරතාවේ පදනම වන්නේ මාධය විශ්ලේෂණය කර ගැනීම යි.

මාධ්‍ය සාක්ෂරතාව හා විඥාපන සන්නිවේදනය ද මාධ්‍ය සාක්ෂරතා අධ්‍යයනයේ දී වැදගත් වේ. නූතන සමාජය නිරන්තරයෙන් තොරතුරු දැනගැනීමේ වුවමනාවකින් පසු වන්නකි. දේශීය, විදේශීය තොරතුරු හෝ විෂයානුබද්ධ තොරතුරු හෝ සමාජීය ජීවියකු ලෙස කටයුතු කිරීමේ දී මිනිසාට වැදගත් වේ. මෙහි දී දැනුම්වත් වීම, පෙලඹවීම සහ සහභාගිත්වය සඳහා තොරතුරු සන්නිවේදනයේ අවශ්‍යතාව පැහැදිලි කරගත යුතු ය.

මාධ්‍ය සාක්ෂරතා අධ්‍යයනයේ දී ශ්‍රව්‍ය, දෘශ්‍ය පාඨ කියවීම හා තේරුම් ගැනීම අවධාරණය කෙරේ. නිවැරදි ව වටහා ගැනීම හෙවත් යථාවබෝධය ලැබීම මෙයින් අදහස් වේ.

මාධ්‍ය සාක්ෂරතාව අධ්‍යයනයේ දී වැදගත් වන තවත් කරුණක් නම් සන්දේශ ප්‍රතිග්‍රහණ හා විශ්ලේෂණ හැකියාව යි. සන්දේශයක් ප්‍රතිග්‍රහණය කිරීමේ දී ඉන්ද්‍රිය ශක්තිය, සංවේදන ශක්තිය, සංජානන ශක්තිය, ප්‍රත්‍යක්ෂණ ශක්තිය ආදිය පිළිබඳ ව අවධානය යොමු කළ යුතු ය. විශ්ලේෂණ කාර්යයේ දී සිදු වන්නේ යමක් දෙස විද්‍යාත්මක ක්‍රමවේදයක් ඔස්සේ බැලීම යි.

මේ සඳහා පරීක්ෂණ, නිරීක්ෂණ, නිගමන ආදිය යොදා ගැනේ. මාධ්‍ය සන්දේශ විශ්ලේෂණයේ දී ද මෙම ක්‍රමවේද යොදා ගැනීම සිදු වේ. සන්දේශ විශ්ලේෂණ ක්‍රමවේද ගණනාවක් තිබේ. අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමය, පාඨ (Text) අධ්‍යයන ක්‍රමය, ආදිය යි.

## 4.4 මාධ්‍ය සාක්ෂරතා අධ්‍යයනය

### 1. මාධ්‍ය සාක්ෂරතා පිළිබඳ මූලිකාංග

- භාෂාවක් ලිවීමට, කියවීමට හෝ තේරුම් ගැනීමට හෝ ඇති හැකියාව.
- මාධ්‍ය සාක්ෂරතා අධ්‍යයනයේ දී ඊට අදාළ මූලිකාංග පිළිබඳ අවධානය යොමු කළ යුතු බව.
  - භාෂා සාක්ෂරතාව
  - තොරතුරු සාක්ෂරතාව
  - ශ්‍රව්‍ය හා දෘශ්‍ය සාක්ෂරතාව
  - අංකිත සාක්ෂරතාව
  - විචාරාත්මක චින්තනය
  - දැනුම ගොඩ නැංවීම
  - සංස්කෘතික ඒකාබද්ධතාව
  - ජීවන හා ව්‍යාවහාරික කුසලතා
  - දැනුම් කළමනාකරණය හා ආරක්ෂණය
- තොරතුරු හුවමාරු මාධ්‍යයේ ස්වභාවය සීමා නොවීම නිසා මාධ්‍ය සාක්ෂරතාවේ මූලිකාංග ද සීමා කර දැක්විය නොහැකි බව.
- විවිධ මාධ්‍ය ඔස්සේ තොරතුරු ප්‍රතිග්‍රහණය, තෝරා ගැනීම හා සම්ප්‍රේෂණයට ඇති හැකියාව.
- ශ්‍රව්‍ය දෘශ්‍ය පාඨ තේරුම් ගැනීමට ඇති හැකියාව.
- අංකිත තාක්ෂණික මෙවලම් භාවිතය.
- සමාජීය සංසිද්ධි තාර්කික ව විග්‍රහ කර ගැනීමේ හැකියාව.
- තොරතුරු පදනම් කරගෙන දැනුම නිපදවීම.
- මාධ්‍ය සන්දේශවල සංස්කෘතික ඒකාබද්ධතාව නිරූපණය වන ආකාරය හඳුනා ගැනීම.
- ජීවන අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා නවීන තාක්ෂණික මාධ්‍ය භාවිත කිරීම.
- දැනුම ගබඩා කර ගැනීම, සංරක්ෂණය හා බෙදා හැරීම.

**2. මාධ්‍ය සාක්ෂරතාව හා විඥාපන සන්නිවේදනය**

- තොරතුරු සමාජයෙහිලා මාධ්‍ය සාක්ෂරතාව වැදගත් වන බව.
- දෛනික ජීවිතය අර්ථාන්විත ව ගත කිරීම සඳහා මාධ්‍ය සාක්ෂරතාව වැදගත් වන බව.
- විවිධ ක්ෂේත්‍රවලට අදාළ බොහෝ තොරතුරු අතිරික්තයක් තොරතුරු සමාජයේ පවතින අතර (විලාසිතා, ආහාර, ක්‍රීඩා, දේශපාලනය, සෞඛ්‍ය, අධ්‍යාපන ආදි තොරතුරු) ඒ අතරින් අවශ්‍ය තොරතුරු පමණක් තෝරා ගැනීම සඳහා මාධ්‍ය සාක්ෂරතාව වැදගත් වන බව.
- වර්තමාන සමාජීය පුද්ගලයා මාධ්‍ය හමුවේ තොරතුරු ග්‍රහණය කරන්නකු පමණක් නොව සම්ප්‍රේක්ෂකයකු ලෙස ද එක ම විට කටයුතු කරන බැවින් මාධ්‍ය සාක්ෂරතාව වැදගත් වන බව.
- විඥාපන යුගයේ දී සමාජීය වශයෙන් දැනුම්වත් වීම, පෙලඹවීම, සහභාගිත්වය ඇති කර ගැනීම සඳහා මාධ්‍ය සාක්ෂරතාව ප්‍රයෝජනවත් වන බව.

**3. මාධ්‍ය සාක්ෂරතා අධ්‍යයනය : ශ්‍රව්‍ය, දෘශ්‍ය ප්‍රවේශ**

- ශ්‍රව්‍ය හෝ දෘශ්‍ය හෝ සන්දේශ කියවීම හා තේරුම් ගැනීම අවශ්‍ය වන බව.
- එහි දී කියවීම යනු හුදු භාෂාව කියවීම පමණක් නොවන බව.
- සන්දේශයක ඇතුළත් සංඥා තම අත්දැකීම්, දැනුම, ආකල්ප හා මතවාදය අනුව අර්ථකථනය කර ගැනීම කියවීම වන බව.
- සිතුවම්, චිත්‍රපට, ඡායාරූප, මූර්ති ආදි සියලු ම දෘශ්‍ය සංදේශ කියවාගත හැකි බව.
- සංගීතය, ගීත, ශබ්ද, කථන රටා, රිද්මය ආදි ශ්‍රව්‍ය සන්දේශ කියවිය හැකි බව.

**4. සන්දේශ ප්‍රතිග්‍රහණය හා විශ්ලේෂණය**

- සන්දේශ ප්‍රතිග්‍රහණය සඳහා ඉන්ද්‍රිය ශක්තිය බලපාන බව.
- සන්දේශ ප්‍රතිග්‍රහණය සඳහා සංවේදන සංජානන ශක්තිය බලපාන බව.
- සන්දේශ ප්‍රතිග්‍රහණය සඳහා ප්‍රත්‍යක්ෂණ ශක්තිය බලපාන බව.
  (වටහා ගැනීම, මතක තබා ගැනීම, ව්‍යවහාරයට ගැනීම)
- විශ්ලේෂණය යනු යමක් දෙස විද්‍යාත්මක ක්‍රමවේදයට අනුව බැලීම යි.
- විශ්ලේෂණයේ දී පරීක්ෂණ, නිරීක්ෂණ, නිගමන වැදගත් වන බව.
- විශ්ලේෂණ ක්‍රම ගණනාවක් ඇති අතර
  1. අන්තර්ගත විශ්ලේෂණය
  2. පයීත අධ්‍යයනය
  3. ආඛ්‍යාන අධ්‍යයනය

  ආදිය විශේෂිත වේ.

**අන්තර්ගත විශ්ලේෂණය**

කවර හෝ සන්දේශයක අන්තර්ගතය විවිධ පැතිකඩ ඔස්සේ සාරාංශ ගත කර අධ්‍යයනය කිරීම යි.

**පඨිත අධ්‍යයනය**

කලාත්මක, දේශපාලන, ආර්ථික, සංස්කෘතික, සමාජීය, තාක්ෂණික සාධක පදනම් කර ගනිමින් කවර හෝ කෘතියක් (සිනමා, චිත්‍ර, නවකතා, වෙළඳ දැන්වීම්, විශේෂාංග)

**ආඛ්‍යාන අධ්‍යයනය**

ස්වයං චරිතාපදාන, ප්‍රතිරචනය, භාෂණ ඉතිහාසය, කතා රචනය, ලිපි රචනය ආදිය පර්යේෂණාත්මක ව අධ්‍යයනය කිරීම මෙසේ හැඳින් වේ.